# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2135/68 - 2019 අගෝස්තු මස 10 වැනි සෙනසුරාදා - 2019.08.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් ඉහත පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2019 මාර්තු මස 13 දිනැති අංක 2114/25 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* උපලේඛනයෙහි I වැනි තීරුවෙහි අයිතම අංක 7ට අදාළව II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති විස්තරය, මෙහි උපලේඛනයෙහි I වැනි තීරුවෙහි අයිතම අංක 7ට අදාළව II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති විස්තරය මගින් ප්‍රතිස්ථාපනය විය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *අංකය* | *විස්තරය* |
|---|---|
| *I* | *II* |
| 7. | 2019 මාර්තු මස 05 වැනි දින හෝ එදිනට පෙර විදේශ විනිමය වැය නොවන පදනම මත ආනයනය කරන ලද හෝ ණයවර ලිපිය 2019 මාර්තු මස 05 වැනි දින හෝ එදිනට පෙර විවෘත කර සහ 2019 මාර්තු මස 05 වැනි දිනට පසුව සංශෝධනය නොකර, ආනයනය කර 2019 සැප්තැම්බර් මස 30 වැනි දින හෝ එදිනට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කරන ලද ඕනෑම මෝටර් වාහනයක් |

08 - 1032


1A - PG 4617 — 542 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*